ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No .

දිනය / திகதி / Date. 2025-02-10

පැමිණිලිකාර පාර්ශවය : W.P.K. වික්‍රමසිංහ මයා,
6/136, කොළඹ පාර,
කුරුණෑගල.

වගඋත්තරකාර පාර්ශවය : 1. විදුහල්පති,
කු/ මලියදේව පිරිමි විද්‍යාලය,
කුරුණෑගල.

2. U.P.උයන්ගොඩ මයා,
අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂක,
වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තුමේන්තුව

**පැමිණිලි අංකය : HRC/HO/1569/23**

**පැමිණිල්ල මඟින් ඉදිරිපත් කර සිටින කරුණු :-**

W.P.K වික්‍රමසිංහ නැමැති පෙත්සම්කරු 2023.04.23 දින මානව හිමිකම් කොමිසම වෙත පැමිණිලි කරමින් දන්වා සිටින්නේ 2023 වර්ෂය සඳහා පළමු වන ශ්‍රේණියට ළමයින් ඇතුළත් කිරීමට අදාළ 28/2022 චක්‍රලේඛ ප්‍රකාරව තම දරුවා කුරුණෑගල මලියදේව විද්‍යාලයට ඇතුළත් කිරීම සඳහා තමන් විසින් අයදුම්පතක් යොමු කළ බවයි. තවදුරටත් චක්‍රලේඛ ප්‍රකාරව පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ දරුවන් අයදුම්කරනු ලබන ECO- 413 යන ගණය යටතේ තමාද පාසලේ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටි බවයි.

එහිදී ලේඛන පරීක්ෂා කිරීමෙන් අනතුරුව තමාට ලකුණු 84.8 ක් හිමි වූ බව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය ප්‍රකාශ කිරීමෙන් පසු, තමා එයට අත්සන් කල බවයි.සම්මුඛ පරීක්ෂණයෙන් අනතුරුව තාවකාලික ලේඛනය පාසලේ දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කරන ලද අතර, තමාගේ දරුවාගේ නම අංක 99 යටතේ පාසලට තෝරා ගත් ළමුන්ගේ ලේඛනයේ සඳහන්ව තිබූ බවයි.එහෙත් පාසලට ආසන්නතාවය අනුව තමාගේ දරුවාගේ නම 97 ස්ථානයේ සඳහන්ව තිබිය යුතු බවට තමා අදහස් කරන බවයි. තාවකාලික ලේඛනය සම්බන්ධයෙන් යොමුවූ අභියාචනා විරෝධතා පරීක්ෂණයෙන් පසුව ස්ථිර ලේඛනය දැන්වීම් පුවරුවෙහි පළ කළ පසු දරුවාගේ නම තෝරාගන්නා ලද ලේඛනයෙන් ඉවත් කොට ලකුණු පහක් අඩු කර ඇත. මෙම ස්ථිර ලේඛනය දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කළේ තාවකාලික ලේඛනය ලේඛනය ඉදිරිපත් කර මාස හතරක් පමණ ගිය පසු වන අතර, 2023 පළමු ශ්‍රේණියේ පාසල් පාසල්වලට ළමයින් ඇතුළත් කිරීම පිළිබඳව අධ්‍යාපන අමාත්‍යාංශයෙන් නිකුත් කළ චක්‍රලේඛයට අනුව එය දෙසැම්බර් මාසය තුළ නිකුත් කළ යුතුව තිබුනි.



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක 14, ආර්. ඒ. ද. මෙල් මාවත කොළඹ -04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு -04. / No. 14, R.A.De Mel Mawatha, Colombo -04.
සභාපති / தவிசாளர் / Chairman: 011- 2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011- 2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 /82
ලේකම් / செயலாளர் / Secretary: 011- 2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

තවද මේ වන විට අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් පළ වන ශ්‍රේණියට සිසුන් ඇතුලත් කිරීමේ දිනය මාර්තු මස 28 ලෙස ප්‍රකාශයට පත් කර තිබූ නමුත්, කු/මලියදේව පිරිමි විද්‍යාලය ස්ථිර ලේඛනය දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කළේ මාර්තු 20 වන දිනෙන් පසුව ය. එසේම අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් ප්‍රකාශ කර තිබුණේ පළමුවන ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරීමට තෝරාගත් සිසුන් මාර්තු 2 සිට 27 දක්වා හඳුනා ගැනීම් සිදු කරන ලෙසටය. ඒ අනුව 1 ශ්‍රේණියට ළමුන් ඇතුළත් කර ගැනීම සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය නියම කරන ලද කාලසීමාවන්ට වඩා ප්‍රමාදව කු/මලියදේව පිරිමි විද්‍යාලය කටයුතු කර ඇත.

දරුවාගේ නම ස්ථිර ලේඛනයෙන් ඉවත් කිරීමට හේතුව පාසල් බලධාරීන් විසින් දැනුම් නොදුන් අතර දරුවා හට විරෝධතාවයක් ඉදිරිපත් වී ඇති බව හෝ විරෝධතා පරීක්ෂණ පැවැත් වූ බවක් හෝ තමා නොදන්නා බව ප්‍රකාශ කර ඇත. විරෝධතාවයක් එල්ල වූයේ නම් 2023 පළමුවන ශ්‍රේණියට සිසුන් ඇතුළත් කර ගැනීමේ චක්‍රලේඛ අංක 28/2022 අංක 11.6 ප්‍රකාරව විරෝධතාවයට ලක්වූ අය කැඳවා කරුණු විමසීම කළ යුතු වුවත්, ඒ සඳහා අවස්ථාවක් සලසාදීම හෝ තමාට දැන්වීම හෝ සිදු කළේ නැත. එසේම තමාව විරෝධතා කමිටුව ඉදිරියට කැඳවා නැවත විමර්ශනයක් සිදු කළේ ද නැත. මේ අනුව අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලය චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කර නොතිබුණ අතර, ලකුණු වෙනස් කිරීම පිළිබඳව තමා දැනුවත් කර නොතිබූ බව පැමිණිලිකරු පවසයි. එම නිසා අවසාන මොහොත දක්වාම දරුවා කු/මලියදේව පිරිමි විද්‍යාලයට ඇතුලත් කරන බලාපොරොත්තුවෙන් සිටි බවත්, එයට අවශ්‍ය සියලු දේවල් ද සූදානම් කරන ලද බවත් පවසා සිටී. නමුත් දරුවා පදනම් විරහිතව කිසිදු පූර්ව දැනුම් දීමකින් තොරව ස්ථිර ලේඛනයෙන් ඉවත් කිරීම හේතු කොට ගෙන දරුවාට කු/ මලියදේව පිරිමි විද්‍යාලයේ අධ්‍යාපනය ලැබීමට ඇති අවස්ථාව අහිමි වී ඇති බවට පැමිණිලිකරු ප්‍රකාශ කර සිටී.

පැමිණිලිකරු විසින් බලාපොරොත්තු වන සහනය වන්නේ, වගඋත්තරකරුවන් චක්‍රලේඛයට අනුකූලව ක්‍රියා නොකිරීම හේතුවෙන් දරුවා පාසලට ඇතුළත් කිරීමට නොහැකි වූ බැවින් එම අවස්ථාව ලබාදෙන ලෙසයි.

<u>පරීක්ෂණයේදී අනාවරණය වූ කරුණු</u>

මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් අවස්ථා තුනකදී දෙපාර්ශවය මානව හිමිකම් කොමිෂන් සභාවේ පුත්තලම කාර්යාලයට කැඳවා පරීක්ෂණ සිදු කරන ලද අතර 2023.07.18 වන දින සිදු කරන ලද පරීක්ෂණයේදී පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරන ලදී.

- සම්මුඛ පරීක්ෂණය මඟින් ලබා දුන් ලකුණු අඩු වීම සම්බන්ධව
- අභියාචනා මණ්ඩලය විරෝධතාවය පිලිබඳ පූර්ව දැනුම් දීමක් හෝ පරීක්ෂණ මණ්ඩලට කැඳවා විධිමත් විමර්ශනයක් හෝ නොකිරීම.

ඉහත සඳහන් කරුණු සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිෂන් සභා පරීක්ෂණයේදී වාචිකව සාකච්ඡා කිරීමෙන් අනතුරුව පැමිණිලිකරු වෙත දන්වා සිටියේ වගඋත්තරකරුවන් වාචිකව සැපයූ පිළිතුරු සම්බන්ධයෙන් විරෝධතා ඇත්නම් සතියක් තුළ ඉදිරිපත් කරන ලෙසයි. ඒ අනුව පැමිණිලිකරු විසින් 2023.07.24 වන දිනැති ලිපිය මගින් විරෝධතා ඉදිරිපත් කළ අතර එම ලිපියේ අඩංගු කරුණු පදනම් කරගෙන නැවත පරීක්ෂණයක් සිදුකිරීමට තීරණය කරන ලදී.

**2023.08.29 වන දින මානව හිමිකම් කොමිෂන් සභාව - පුත්තලම උප කාර්යාලයේදී සිදුකරන ලද පරීක්ෂණයෙන් අනාවරණය වූ කරුණු**

පරීක්ෂණයේදී පැමිණිලිකරු සඳහන් කර සිටියේ තාවකාලික ලැයිස්තුවේ තමාගේ දරුවාගේ නම තිබූ නමුත්, ඉන් පසුව ස්ථිර ලැයිස්තුවෙන් නම ඉවත් වීම සම්බන්ධයෙන් විධිමත් දැනුම්දීමක් සිදු නොකළ බවත්, අභියාචනා මණ්ඩලයට ඉදිරිපත්ව තමන්ගේ කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාවක් නොලද බවත්ය.

ඉහත පැමිණිලිකාරියගේ ප්‍රකාශය සම්බන්ධයෙන් දෙවන වගඋත්තරකරු වන U.P. උයන්ගොඩ, අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂක සඳහන් කර සිටින්නේ, මෙම පැමිණිලිකරු පදිංචි ස්ථානයේ සිට පාසලට ඇති දුර ප්‍රමාණය සම්බන්ධයෙන් විරෝධතාවයක් ලැබුණු බවත්, එම විරෝධතාව සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමට පැමිණිලිකරු දුරකථන ඇමතුමක් මඟින් දැනුවත් කර අභියාචනා මණ්ඩලයේ නිළධාරින් අදාළ ස්ථානයට ගිය බවත්, එම අවස්ථාවේ පෙත්සම්කාර පාර්ශවයේ කිසිවෙකු එම ස්ථානයේ නොසිටි බවත්ය. එබැවින් නැවතත් දුරකථනය මගින් ඇමතුමක් ලබාගත් බවත්, එයට පැමිණිලිකරු විසින් පිළිතුරු ලබා දුන් බවත් සඳහන් කර සිටින අතර පැමිණිලිකරු සමඟ දුරකථනය මගින් කතා කළ බව ඔප්පු කිරීම සඳහා විස්තරාත්මකව දුරකථන බිල්පතක් අවශ්‍ය නම් ඉදිරිපත් කළ හැකි බවත් සඳහන් කර සිටියි.

වගඋත්තරකරුගේ ප්‍රකාශය සම්බන්ධයෙන් පැමිණිලිකරු තවදුරටත් සඳහන් කර සිටින්නේ තමා විසින් පාසලට දුරකතන අංක දෙකක් ලබා දී තිබුණු බවත් එක් අංකයක් මගින් නිසි පිළිතුරක් නොලැබුනේ නම් අනෙක් දුරකථන අංකය වෙත කතා කර දැනුවත් කළ යුතුව තිබූ නමුත් එසේ සිදු නොකළ බවයි. තවද, ලියාපදිංචි තැපැල මගින් විරෝධතාවය පිලිබඳ දැනුවත් කිරීමට හැකියාවක් තිබූ නමුත් එයද පාසල් බලධාරීන් විසින් සිදු නොකළ බවයි. දෙවන වගඋත්තරකරු ඉහත ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රකාශ කර සිටින්නේ පළමු දුරකථන අංකය මගින් අවශ්‍ය දැනුවත් කිරීම සිදුකල බැවින්, දෙවන දුරකථන අංකයට කතා කිරීමේ අවශ්‍යතාවයක් ඇති නොවූ බවයි.

පැමිණිලිකරු චක්‍රලේඛයේ 12.1.2 වගන්තිය (ඇමුණුම 01) උපුටා දක්වමින් සඳහන් කර සිටින්නේ තාවකාලික ලැයිස්තුවෙන් ඉවත් වන ළමුන්ගේ මව්පියන් නැවත අභියාචනා හා විරෝධතා මණ්ඩලය වෙත කැඳවා ඔවුන්ගේ සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව අවසන් තීරණයට එළඹිය යුතුය යන්න නෛතික කාර්යපටිපාටිය වුවද ,තමාව එසේ ගෙන්වා දැනුවත් නොකළ බවයි.

ඉහත ප්‍රකාශය සම්බන්ධයෙන් දෙවන වගඋත්තරකරු සඳහන් කර සිටින්නේ විරෝධතාවය ඉදිරිපත්ව ඇත්තේ දුර ප්‍රමාණය පදනම් කරගෙන බැවින් පෙත්සම්කරු පදිංචි ස්ථානයට ගොස් පරීක්ෂා කිරීමෙන් අනතුරුව, අදාල පාර්ශවය එම ස්ථානයේදීම දුරකථනය මඟින් දැනුවත් කළ බවයි. එබැවින් පෙත්සම්කරු නැවත අභියාචනා මණ්ඩලයට කැඳවීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බවයි. ඒ අනුව මෙම පැමිණිලිකරුගේ ගැටලුවද දුර ප්‍රමාණය සම්බන්ධයෙන් ගැටලුවක් බැවින් දුරකථනය මඟින් දැනුම්දීමක් සිදුකර එම ස්ථානයට ගිය නමුත් අභියාචනා මණ්ඩලයට කැඳවීමක් සිදු නොකළ බවයි. පැමිණිලිකරු නැවත අවධාරණය කර සිටින්නේ තමන්ගේ පදිංචිය නගරාසන්නයේ ම තිබෙන බැවින්, සම්මුඛ පරීක්ෂණයේදී සියලු කරුණු සලකා බලා දුර ප්‍රමාණය සම්බන්ධයෙන් ලකුණු ලබා දීම සිදු සිදුකර තිබූ නමුත්, ඉන්පසුව ලකුණු පහක් අඩු කිරීම තරයේ ප්‍රතික්ෂේප කරන බවයි. තවද එම නිවස ආසන්නයේ සිටින ළමයා පවා එම පාසලටම යන බව සඳහන් කර සිටියි. එසේම ස්ථාන පරීක්ෂණය සිදුකර දුර ප්‍රමාණය හේතුවෙන් පමණක් අවස්ථාව අහිමි වූ බව වගඋත්තරකරු සඳහන් කර සිටින නමුත්,පැමිණිලිකරු එය පිලිනොගනියි.

පැමිණිලිකරු අවසන් වශයෙන් සඳහන් කර සිටින්නේ, දරුවා සහ දෙමාපියන් වන ඔවුන් මෙ හේතුවෙන් දැඩි මානසික පීඩාවකට ලක්ව ඇති බවත්, අධ්‍යයන කාර්ය මණ්ඩලය පදනම්කරගෙන ලකුණු අවස්ථාව ලබා දීමට හැකියාවක් තිබූ නමුත්, එය ද නොසලකා හැරීම මත අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවයි.

වගඋත්තරකරු සඳහන් කර සිටින්නේ අධ්‍යයන කාර්ය මණ්ඩලය සම්බන්ධයෙන් ලබා දෙන ලකුණු පිළිබඳව, මෙම පැමිණිලිකරුට පිළිතුරු දීමට අවශ්‍යතාවයක් නොමැති බවයි.

<u>2023/09/25 දින දෙවන වගඋත්තරකරු වන අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂක විසින් ඉදිරිපත් කරන ලද ලිඛිත වාර්තාව</u>

මානව හිමිකම් කොමිෂන් සභාවේ පුත්තලම උප කාර්යාලය මගින් 2023/09/25 දින පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් වාර්තාවක් ඉදිරිපත් කරන ලෙසට ඉල්ලා සිටින ලදී.

- පැමිණිලිකරුගේ පදිංචිය සම්බන්ධයෙන් පැමිණි විරෝධතා ලිපිවල පිටපත්
- පදිංචිය සම්බන්ධයෙන් අභියාචනා මණ්ඩලය මගින් සිදු කරන ලද පරීක්ෂණ වාර්තාව

ඉහත කරුණු සම්බන්ධව වගඋත්තරකරු විසින් එවන ලද වාර්තාවේ සඳහන්ව ඇත්තේ පැමිණිලිකරුගේ පදිංචිය සම්බන්ධයෙන් විරෝධතාවයක් ඉදිරිපත් වූ අතර ඒ සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට පැමිණෙන ලෙස දුරකථනයෙන් දැනුවත් කළ අතර විරෝධතා සම්බන්ධයෙන් ස්ථානීය පරීක්ෂණයක් ද සිදු කළ බවයි. ඒ අනුව පැමිණිලිකරු පදිංචි නිවසට ගොස් ස්ථානීය පරීක්ෂණය සිදු කිරීමේදී පාසල් දෙකක් සඳහා ලකුණු අඩු විය යුතු බව අභියාචනා මණ්ඩලය තීරණය කළ බවයි. නිවසට පැමිණ පරීක්ෂණය සිදු කරන අවස්ථාවේදී ඔහුගේ නිවසේ කිසිවෙකු නොසිටි බැවින් එම ස්ථානයේ සිටම පැමිණිලිකරුට දුරකථන ඇමතුමක් ලබා දුන් නමුත් ඔහු එම ස්ථානයට පැමිණ නැති බව සඳහන් කර ඇත.

ප්‍රථම සම්මුඛ පරීක්ෂණයෙන් පසු ලබා ගත් ලකුණු තහවුරු කර ගැනීම සඳහා සිදුකරන ස්ථානීය පරීක්ෂණයේදී ශාන්ත ආනා විද්‍යාලයට වඩා ආසන්න මලියදේව ආදර්ශ විද්‍යාලය හා නිශ්ශංක විද්‍යාලය සඳහා ලකුණු අඩු විය යුතු බව නිලධාරීන් තහවුරු කර ඇත.

නමුත් පැමිණිලිකරුට සම්මුඛ පරීක්ෂණයේදී ආසන්නතාව සඳහා එක් පාසලකට පමණක් ලකුණු අඩු වී ඇති බැවින් ඔහුට තවත් ලකුණු පහක් අඩු විය යුතු බවත් ප්‍රථම සම්මුඛ පරීක්ෂණයෙන් පසු ලබා ගත් ලකුණු තහවුරු කර ගැනීම සඳහා ස්ථානීය කරීක්ෂණයක් සිදු කළ නිලධාරීන්ට ලකුණු 05ක් අඩු කිරීමට අතපසුවී ඇති බවත් වයඹ පලාත් අධ්‍යාපන දෙපාර්තුමේන්තුව සිය වාර්තාවේ සඳහන් කරයි. මෙම අතපසුවීම හේතුවෙන් තාවකාලික ලැයිස්තුවේද ඔහුට හිමි ලකුණ 84.8 ලෙස නොවෙනස්ව සඳහන්ව තිබූ බැවින් පැමිණිලිකරුගේ නම පාසලට ඇතුල් වීම සඳහා සුදුසුකම් ලද තාවකාලික ලැයිස්තුවට ඇතුලත්ව තිබූ බවත් වැඩිදුරටත් කරුණු දක්වයි.

ඒ අනුව පැමිණිලිකරුගේ දරුවා 2023 වර්ෂයේ මෙම විද්‍යාලයේ පළමු ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරීමේ තාවකාලික ලැයිස්තුවට ඇතුළත් වුවද විද්‍යාලයට ඇතුළත් වීම සඳහා සුදුසුකම් ලද අවසාන ලේඛනයට ඇතුළත් වී නොමැති බව දක්වයි.

<u>වගඋත්තරකරුගේ වාර්තාව සම්බන්ධයෙන් පැමිණිලිකරුගේ කරුණු දැක්වීම.</u>

2023.10.07 වන දින පැමිණිලිකරු ඉදිරිපත් කර ඇති ලිඛිත කරුණු දැක්වීමට අනුව සම්මුඛ පරීක්ෂණයේදී පැමිණිලිකරු ට ලකුණු 84.8 ක් හිමි වූ නමුත්, එහිදී ද අමතර ලේඛන යටතේ තමන් විසින් ඉදිරිපත් කරන ලද බැංකුපොත් වලට ලකුණු ලබාදීම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් තමාට ලකුණක් අහිමි වූ බවට සඳහන් කරයි.

සම්මුඛ පරීක්ෂණයේ දී කු/ශාන්ත ආනා විද්‍යාලයට පමණක් ලකුණු පහක් අඩු කළ අතර තමන් විසින් ඉදිරිපත් කරන ලද අයදුම්පතේ ද එය ලකුණු කර තිබූ බව සත්‍ය බව පවසයි..

කු/මලියදේව විද්‍යාලය හා අභියාචනා මණ්ඩලයේ සභාපති මානව හිමිකම් කොමිෂන් සභාවේ පුත්තලම උප කාර්යාලය වෙත කරුණු ඉදිරිපත් කරමින් කියා සිටින්නේ තාවකාලික ලැයිස්තුව ප්‍රකාශයට පත් කිරීමට ප්‍රථම පැවැත්වූ ස්ථානීය පරීක්ෂණයෙන් ආසන්න වෙනත් පාසල් දෙකක් සඳහා ලකුණු අඩු කළ බව නමුත්, එය එසේ සිදු වූවා නම් ලැබිය යුතු ලකුණ විය යුත්තේ 79.8 කි. නමුත් තාවකාලික ලේඛනයේ ඔවුන්ට හිමි ලකුණු වූයේ 84.8 ක් වන බවයි.

තවදුරටත් ඔවුන් සම්මුඛ පරීක්ෂණයේදී ස්ථානීය පරීක්ෂණය සිදු කළ නිලධාරින්ට ලකුණු පහක් අඩු කිරීමට අතපසු වී ඇති බව පැවසූ නමුත්, රටේ අනාගතය භාර ගැනීමට සිටින දරුවන් පිළිබඳ කටයුතු කරන අධ්‍යාපන ක්ෂේත්‍රයේ නිලධාරීන්ට මෙසේ අතපසු වීම් සිදු වීම සුළු කොට තැකිය නොහැකි බව පවසයි.

එම නිලධාරීන් ට අවස්ථා 02 ක දී අතපසු වීම් සිදු වී ඇත. එනම්,

- ඔවුන් පවසන පරිදි සම්මුඛ පරීක්ෂණයේ දී ආසන්නතාවය සඳහා තවත් පාසලකට ලකුණු අඩු කිරීමට අමතක වීම.
- තාවකාලික ලැයිස්තුව ප්‍රදර්ශනය කිරීමට ප්‍රථම ස්ථානීය පරීක්ෂණය සිදු කළ බවත්, එයින් පාසල් දෙකකට ලකුණු අඩු කළ බවත්, ඔවුන් පැවසුවත් එසේ වූවා නම් ලැබිය යුතු ලකුණ විය යුත්තේ 79.8 කි. නමුත් එලෙස ලකුණු අඩු කිරීමකින් තොරව 84.8 ලෙස පෙර පැවති ලකුණම ඇතුලත් තාවකාලික ලේඛනය ඉදිරිපත් කිරීම.

වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකරුගේ දරුවාට විරෝධතාවයක් එල්ල වූ බවත්, එනම් එය කු/ශාන්ත ආනා විද්‍යාලය සඳහා ලකුණු පහක් අඩු විය යුතු බව පවසමින් වන නමුත්, පැමිණිලිකරුවන් ඉදිරිපත් කළ අයදුම්පතේම ආසන්නතාවය සඳහා ලකුණු පහක්, කු/ශාන්ත ආනා විද්‍යාලය සඳහා අඩු කර අයදුම්පත ඉදිරිපත් කළ යුතු අතර ලකුණු 84.8 ලැබී තිබුණේ ඒ අනුව වන බවයි.

එසේම එහිදී විරෝධතාවයක් ඇති වූවා නම්,එහිදී ලියාපදිංචි තැපැලෙන් ලිපියක් මඟින් දැනුවත් කර පැමිණිලිකරුවන් ගෙන්වා ඒ පිළිබඳව කරුණු විමසා බැලිය යුතු බවයි. නමුත් එවැන්නක් සිදු නොවී දුරකථනය මඟින් දැනුවත් කළ බව පැවසුව ද, එවද සිදු නොවූ බවයි.

එසේම අදාල විරෝධතාවය දැක්වූවන් කැඳවා ඔවුන්ගේ ද තොරතුරු ලබා ගත යුතු නමුත් ඔවුන් ගෙන් වූ බවට ද ලිඛිත සාක්ෂි ඉදිරිපත් කර නොමැති බවයි.

<u>2024.08.22 වන දින මානව හිමිකම් කොමිෂන් සභාව - කොළඹ ප්‍රධාන කාර්යාලයේදී සිදුකරන ලද පරීක්ෂණයෙන් අනාවරණය වූ කරුණු</u>

පරීක්ෂණයේදී පැමිණිලි පාර්ශවය මේ සම්බන්ධයෙන් කරුණු දක්වමින් සම්මුඛ පරීක්ෂණයේදී තමා ඉදිරිපත් කර පරිදි ශාන්ත ආනා විද්‍යාලයට ආසන්නතාව මත ලකුණු අහිමිවීම සිදු නොවන බව පවසයි.අභියාචනා හා විරෝධතා මන්ඩලය ස්ථානීය පරීක්ෂණයේදී මෙය තහවුරු කරයි. එසේ නමුත් පැමිණිලි පාර්ශවය තමන් විසින් සිදුකරන ලද දුර ප්‍රමාණ ගණනය කිරීම් අනුව අභියාචනා හා විරෝධතා මණ්ඩලය දක්වන පරිදි ආසන්න පාසල් දෙකක් සඳහා (එනම් මලියදේව ආදර්ශ විද්‍යාලයට හා නිශ්ශංක විද්‍යාලයට) ලකුණු අඩු නොවන බවත් ලකුණු අඩු විය යුත්තේ එක් පාසලකට (එනම්

නිශ්ශංක විද්‍යාලයට පමණක් ) බවත් ඒ අනුව ස්ථානීය පරීක්ෂණයෙන් පසුව අභියාචනා මණ්ඩලය විසින් සිදුකරන ලද ලකුණු පහක් අඩු කිරීම අනීතික බවත් පවසන ලදි.

වගඋත්තරකාර පාර්ශවය වෙනුවෙන් පෙනී සිටි අභියාචනා මණ්ඩලයේ ලේකම් අරුණ බණ්ඩාර මහතා හා පැමිණිලි පාර්ශවය ඉදිරියේ, රජයේ මිනින්දෝරු දෙපාර්තුමේන්තුව විසින් නිකුත් කර ඇති කුරුණෑගල නගරයේ 1:10000 පරිමාණයේ සිතියමක් භාවිතා කරමින් අයදුම්කරුගේ නිවස කේන්ද්‍රය කර ගෙන කුරුණෑගල මලියදේව විද්‍යාලයේ ප්‍රධාන කාර්යාලයට ඇති දුර අරය ලෙස ගනිමින් වෘත්තයක් අඳින ලදි. එකී කවය තුළට නිශ්ශංක විද්‍යාලය ඇතුළත් වූ නමුත් මලියදේව ආදර්ශ විද්‍යාලය හා ශාන්ත ආනා විද්‍යාලය කවයෙන් පිටත ඇති බව නිරීක්ෂණය වේ. එබැවින් ලකුණු අඩු කල යුත්තේ එක් පාසලකට පමණක් බව එනම් නිශ්ශංක විද්‍යාලයට පමණක් බව නිරීක්ෂණය විය. මීට අමතරව පැමිණිලි පාර්ශවය ගූගල් සිතියම් මාර්ගයෙන් තමාගේ නිවසේ සිට පාසලට ඇති දුර ප්‍රමාණය අරය ලෙස ගෙන කවයක් ඇඳ කොමිෂන් සභාව ඉදිරියේ කරුණු දැක්වීමක් කළ අතර එහිදීද නිශ්ශංක විද්‍යාලයට පමණක් ලකුණු 05ක් අඩු කල යුතු බව නිරීක්ෂණය විය. පරීක්ෂණයේදී වගඋත්තරකාර පාර්ශවය වෙනුවෙන් පෙනී සිටි අරුණ බණ්ඩාර නැමැති අභියාචනා මණ්ඩලයේ ලේකම් මෙම තත්ත්වය කොමිෂන් සභාව ඉදිරියේ පිළිගන්නා ලද අතර දරුවා පාසලට ඇතුළත් කර ගැනීම සම්බන්ධයෙන් වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන බව ප්‍රකාශ කරන ලදි.

ඒ අනුව කු.මලියදේව විද්‍යාලය විසින් 2024.08.24 දින මේ සම්බන්ධයෙන් වාර්තාවක් කොමිෂන් සභාව වෙත යොමු කරන ලදි. එකී වාර්තාව අනුව උක්ත පැමිණිලිකරුගේ නිවසේ සිට මලියදේව විද්‍යාලයට ඇත්තේ ආසන්නතාව අදාල වර්ෂයේ 1 ශ්‍රේණියට දරුවා ඇතුලත් කර ගැනීම සම්බන්ධව නිකුත් කරන ලද අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක 28/2022 චක්‍රලේඛ 74.5 වගන්තියට අනුව සටහන් කර ගන්නා බවත්, ඒ අනුව මෙම විද්‍යාලයට වඩා ආසන්න පවතින උක්ත පැමිණිලිකරුගේ දරුවාට ඇතුලත් විය හැකි ප්‍රාථමික අංශ සහිත රජයේ පාසල් 02 ක් හඳුනා ගතහැකි බව දක්වයි.

පැමිණිලිකරුගේ නිවසේ සිට පාසල් වලට ඇති දුර ප්‍රමාණයන් වාර්තාවෙහි පහත පරිදි දක්වා ඇතත් එනම් මලියදේව ආදර්ශ විද්‍යාලයේ 655.73 m, නිශ්ශංක විද්‍යාලයේ 483.7m, මලියදේව විද්‍යාලයේ 701.23m යනුවෙනි. මෙකී දුර ප්‍රමාණයන් ගණනය කිරීම විද්‍යාලයේ තොරතුරු තාක්ෂණය පිලිබඳ ගුරුවරයා ගූගල් සිතියමක් යොදා ගනිමින් සිදුකරන ලද බව විද්‍යාලයෙන් විමසීමේදී දැන ගත හැකිවිය. අභියාචනා හා විරෝධතා මණ්ඩලය විසින් උක්ත පැමිණිලිකරු වෙත ලබා දී ඇති දුර ප්‍රමාණයන් නිවැරදි බැවින් මෙම පැමිණිලිකරු සම්බන්ධව අභියාචනා විරෝධතා මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණය නිරවද්‍ය බව වගඋත්තකරුගේ වාර්තාවේ අවසාන නිගමනය වේ.

එසේම විරෝධතාවය එල්ලවීමට පෙර සම්මුඛ පරීක්ෂණයේදී පැමිණිලිකරුවන් ඉදිරිපත් කළ අයදුම්පතේ ආසන්නතාව සඳහා ලකුණු පහක් කු/ ශාන්ත ආනා විද්‍යාලය සඳහා අඩු කර එකී අයදුම්පත ඉදිරිපත් කර ඇති බවත් ඒ මත පදනම්ව ලකුණු 84.9 සම්මුඛ පරීක්ෂණයේදී පැමිණිලිකරුගේ දරුවාට ලැබී තිබුණු බවත් වගඋත්තරකරු තවදුරටත් පවසයි.

<u>නිරීක්ෂණ :-</u>

- පාසලට ළමුන් ඇතුලත් කර ගැනීමේ තාවකාලික ලේඛනය ප්‍රදර්ශනය කිරීමේදී ආසන්නතාව යටතේ මෙම දරුවා 99 ස්ථානයේ සිටි බව නිරීක්ෂණය විය.
- තාවකාලික ලේඛනයේ දී දරුවාට ලකුණු 84.8 ක් හිමිව තිබූ නමුත් ස්ථිර ලේඛනය ප්‍රදර්ශනය කිරීමේදී ලකුණු පහක් අඩු වී එම ලකුණු මට්ටම 79.8 බවට පත්ව තිබූ බව නිරීක්ෂණය වන අතර, ඒ අනුව දරුවා ස්ථිර ලේඛනයෙන් ඉවත් වී තිබූ බව නිරීක්ෂණය විය.

- චක්‍ර ලේඛයේ 7.2.1.2 වගන්තියට අනුව බැංකු පොත් ඇතුළු අනෙකුත් ලේඛනවලට ලකුණක් බැගින් ලබාදිය යුතු බව සඳහන්ව තිබූ නමුත් බැංකු පොත සඳහා හිමි විය යුතු ලකුණ ලබා දී නොමැති බව නිරීක්ෂණය විය.

- පැමිණිලිකරු ස්ථිර ලැයිස්තුවෙන් ඉවත් කිරීම සම්බන්ධයෙන් පැමිණිලිකරු සඳහා ඇති විරෝධතා සම්බන්ධයෙන් සාකච්ඡා කළ යුතු බව 2022.06.15 දිනැති අංක 28/2022 දරණ, 2023 පාසල්වල පළමු ශ්‍රේණියට ළමුන් ඇතුලත් කර ගැනීමේ චක්‍රලේඛය මඟින් 11.6 වගන්තියට අනුව සඳහන්ව ඇතත්, එසේ සාකච්ඡා කිරීමට චක්‍ර ලේඛය ප්‍රකාරව කැඳවීමක් කර නොමැති බව නිරීක්ෂණය වේ. වගඋත්තරකරුවන් විසින් දුරකථන ඇමතුම් ලබා දුන් බව පරීක්ෂණයේ දී සඳහන් කර සිටි නමුත්, ලිඛිතව පැමිණිලිකරු වෙත එය දන්වා නොමැති බවද නිරීක්ෂණය වේ.

- ස්ථිර ලේඛනය ප්‍රදර්ශනය කිරීමට ප්‍රථම තාවකාලික ලේඛනයෙන් ඉවත්වන අයදුම්කරුවන්ට ඒ බව දන්වා නැවත ඔවුන්ගේ තොරතුරු පරීක්ෂා කර බලා ස්ථිර ලේඛනය ප්‍රදර්ශනය කළ යුතු බව චක්‍ර ලේඛය ප්‍රකාරව සඳහන්ව ඇතත්, නිසි සන්නිවේදනයක් සිදු නොකිරීම හේතුවෙන් පැමිණිලිකරුට තමාගේ කරුණු ඉදිරිපත් කිරීමට තිබූ අවස්ථාව ගිලිහී ඇති බව නිරීක්ෂණය වේ.

- දුරකථනය මගින් විරෝධතාවය පිලිබඳ පණිවිඩ ලබා දුන් බව සනාථ කිරීම සඳහා වගඋත්තරකරුවන් විසින් විස්තරාත්මක දුරකථන වාර්තාවක් ඉදිරිපත් කර නොමැති බවද නිරීක්ෂණය වේ.

- පැමිණිලිකරුට එරෙහිව විරෝධතාවයක් ඉදිරිපත් වී ඇත්තේ කු/ශාන්ත ආනා විද්‍යාලයට ලකුණු 05ක් අඩු කිරීම සම්බන්ධයෙනි. අදාල විරෝධතාවය නිසි පරිදි අධ්‍යයනය කළේ නම් පැමිණිලිකරුගේ අයදුම්පත ඉදිරිපත් කරන අවස්ථාවේදීම එම විද්‍යාලයට ලකුණු 05 ක් අඩු කර ඇති බව නිරීක්ෂණය වේ. එය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පිළිගෙන ඇති බවද අත්සන් වලින් තහවුරු වේ. එම නිසා මෙම විරෝධතාවය පැමිණිලිකරුට එරෙහිව ඉදිරිපත් නොවූවක් වන බැවින් එය ප්‍රතික්ෂේප කිරීමට වගඋත්තරකරුවන්ට අවස්ථාව තිබූ බව නිරීක්ෂණය වේ.

- සත්‍ය වශයෙන්ම ලකුණු පහක් අඩුවිය යුත්තේ නිශ්ශංක විද්‍යාලයට වුවද, සම්මුඛ පරීක්ෂණයේදී ශාන්ත ආනා විද්‍යාලයට අතපසුවීමකින් ලකුණු 05 ක් අඩුවී තිබීම සම්මුඛ පරීක්ෂණයෙන් පසු සිදු කරන ස්ථානය පරීක්ෂාවේදී හෝ අනාවරණය වී නොමැති බව නිරීක්ෂණය වේ. ශාන්ත ආනා විද්‍යාලය සම්බන්ධව එල්ල වූ විරෝධතාවය පරීක්ෂාවට ගොස් අභියාචනා හා විරෝධතා මණ්ඩලය ශාන්ත ආනා විද්‍යාලයට 720m , කු/ ආදර්ශ විද්‍යාලයට 649m ලෙසත් නිශ්ශංක විද්‍යාලයට 514m ලෙසත් සිතියම යොදාගෙන ගණනය කර ඇත. ඒ අනුව, ශාන්ත ආනා විද්‍යාලයට ලකුණු අඩු කිරීමක් සිදු නොවිය යුතු බවත් කු/මලියදේව ආදර්ශ විද්‍යාලයට හා නිශ්ශංක විද්‍යාලයට ලකුණු 05 බැගින් 10 ක් අඩු විය යුතු බවත් තීරණය කොට ඇති බව නිරීක්ෂණය වේ. ඒ අනුව සම්මුඛ පරීක්ෂණයේදී ශාන්ත ආනා විද්‍යාලයට පමණක්ම අතපසුවීමකින් අඩු වී තිබූ ලකුණු 05 නිවැරදි කිරීමකින් තොරව එලෙසම තිබියදී තවත් ලකුණු 05 ක් අඩුකොට අවසානයේදී කු/මලියදේව ආදර්ශ විද්‍යාලයට හා නිශ්ශංක විද්‍යාලයට ලකුණු 10 අඩු කොට ඇති බව පෙනී යයි. මෙලෙස අතපසුවීම නිවැරදි කිරීම වෙනුවට කෙසේ හෝ අවශ්‍ය ලකුණු ප්‍රමාණය හුදු ප්‍රමාණාත්මකව අඩු කිරීමක් සිදුකිරීම දරුවන් සම්බන්ධයෙන් වගකිය යුතු බලධාරී මණ්ඩලයකින් සිදු නොවිය යුක්තකි.

- අභියාචනා හා විරෝධතා මණ්ඩලය කු/මලියදේව පිරිමි විද්‍යාලයට 677m, කු/මලියදේව ආදර්ශ විද්‍යාලයට 649 m, නිශ්ශංක විද්‍යාලයට 514 m ලෙසත් සිතියම යොදාගෙන ගණනය කර ඇත. 2024.08.28 දින නැවතත් කු/මලියදේව පිරිමි විද්‍යාලය විසින් ම කොමිෂන් සභාව වෙත යොමු කරනු ලබන අවසන් වාර්තාවට අනුව, කු/මලියදේව විද්‍යාලයට

701.23m, කු/මලියදේව ආදර්ශ විද්‍යාලයට 655.73m, නිශ්ශංක විද්‍යාලයට 483.57m ලෙසත් ගූගල් සිතියම යොදාගෙන ගණනය කර දක්වා ඇත. ඒ අනුව වරින් වර පාසල විසින් සිදු කරන ලද දුර ප්‍රමාණ ගණනය කිරීම් එකිනෙකට වෙනස් බව නිරීක්ෂණය වේ. පාසල් බලධාරීන් විසින් ආසන්නතාව පරීක්ෂා කිරීම සඳහා රජයේ මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති 1:10000 පරිමාණයේ සිතියම භාවිතා කළ යුතු බවත් අමතරව ගූගල් සිතියම සමග සංසන්දනය කර තීරණය ගත යුතු බවත් චක්‍රලේඛයේ පැහැදිලිව දක්වා ඇත. නමුත් පාසල විසින් මුල් අවස්ථාවේ පමණක් මිනින්දෝරු දෙපාර්තමේන්තුව නිකුත් කළ සිතියම් යොදාගෙන ඇති බවත් පසු අවස්ථාවල යොදාගත් ගූගල් සිතියම තුළින් එකිනෙකට වෙනස් තීරණ වලට වරින්වර එළඹ ඇති බවට නිරීක්ෂණය වේ.

- මේ අනුව විසඳා ගතයුතු ප්‍රශ්නය වන්නේ සැබවින්ම ආසන්න පාසල් දෙකක් සඳහා (එනම් මලියදේව ආදර්ශ විද්‍යාලයට හා නිශ්ශංක විද්‍යාලයට) ලකුණු අඩු නොවන බවටත් ලකුණු අඩු විය යුත්තේ එක් පාසලකට (එනම් නිශ්ශංක විද්‍යාලයට පමණක් ) බවටත් පෙත්සම්කරුවන් විසින් නගනු ලබන තර්කය නිවැරදි ද නොවසේනම්, පාසල් බලධාරීන් විසින් පවසන පරිදි , කු/මලියදේව ආදර්ශ විද්‍යාලයට හා නිශ්ශංක විද්‍යාලයට යන පාසල් දෙකටම ලකුණු 10 ක් අඩු කලයුතුද යන්නයි.

- මේ පිළිබඳව නිශ්චිත තීරණයකට එළඹීමට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට හැකියාවක් නොමැත. එබැවින් ඉහත සඳහන් කරන ලද පාසල් අතර ඇති දුර ප්‍රමාණයන් බලයලත් මිනින්දෝරුවෙකු විසින් මැන සහතික කර ඉදිරිපත් කරන ලෙසට 2024.10.03 දින ලිපියක් මාර්ගයෙන් පෙත්සම්කරුට දැනුම් දෙන ලදී. ඒ අනුව ලියාපදිංචි අංක 19880357 යන ලියාපදිංචි අංකය යටතේ ලියාපදිංචි බලපත්‍රලාභී ඒ.ඒ.පද්මදාස නැමති රජයේ බලයලත් මිනින්දෝරුවෙකු විසින් කු/මලියදේව ආදර්ශ විද්‍යාලයට, කු/මලියදේව පිරිමි විද්‍යාලයට සහ කු/නිශ්ශංක විද්‍යාලයට යන ප්‍රශ්න ගත පාසල් වල කාර්යාලයේ සිට පෙත්සම්කරුගේ නිවසේ ප්‍රධාන ගේට්ටුවට ඇති දුර ප්‍රමාණයන් පෙත්සම්කරුවන් විසින් ඉදිරිපත් කර සිටී. ඒ අනුව කු/මලියදේව විද්‍යාලයට 657.5m, කු/මලියදේව ආදර්ශ විද්‍යාලයට 685.2 m, නිශ්ශංක විද්‍යාලයට 510.3 m ලෙසත් ගණනය කිරීම සිදු කර ඇත.මේ අනුව නිරීක්ෂණය වන්නේ , ආසන්න පාසල් දෙකක් සඳහා (එනම් මලියදේව ආදර්ශ විද්‍යාලයට හා නිශ්ශංක විද්‍යාලයට) ලකුණු අඩු නොවන බවටත් ලකුණු අඩු විය යුත්තේ එක් පාසලකට (එනම් නිශ්ශංක විද්‍යාලයට පමණක් ) බවටත් පෙත්සම්කරුවන් විසින් කරනු ලබන ප්‍රකාශය නිරවද්‍ය බවයි.

- 2023 වර්ෂය සඳහා කු/මලියදේව පිරිමි විද්‍යාලයට ළමුන් ඇතුළත් කර ගැනීමේ අවසාන ලකුණ වී ඇත්තේ ලකුණු 85 බවත් මේ වන විට පොරොත්තු ලේඛනයේ නියමිත ලකුණු ප්‍රමාණයට එනම් ලකුණු 85ට වඩා ලකුණු අඩුවෙන් ලැබූ ළමුන් හත්දෙනෙක් පාසලට ඇතුලත් කරගෙන ඇති බවත්, පාසල් බළධාරීන්ගෙන් විමසීමේදී දැන ගැනීමට හැකි විය. 2023 වර්ෂය සඳහා පාසලට අවසාන වශයෙන් ඇතුලත් කරගනු ලැබූ ශිෂ්‍යයා ලැබූ ලකුණ වන්නේ ලකුණු 83 ක් බවත් පෙත්සම්කාර පාර්ශවයට 84.8 ක ලකුණු ප්‍රමාණයක් සැබවින්ම හිමිවිය යුතු බවත් නිරීක්ෂණය වේ.

<u>නිගමනය</u>

පැමිණිලිකරුගේ දරුවාට සම්මුඛ පරීක්ෂණයේදී ආසන්නතාවය උදෙසා කු/ශාන්ත ආනා විද්‍යාලයට ලකුණු 5, අඩු කිරීමෙන් අනතුරුව ලකුණු 84.8, ලැබී ඇත. සම්මුඛ පරීක්ෂණයෙන් පසු සිදුකරන ලද ස්ථානීය පරීක්ෂාවෙන් පසුව ඉදිරිපත් කළ තාවකාලික ලේඛනයේද දරුවාගේ නම ඉදිරියේ ලකුණු 84.8 නොවෙනස්ව පැවැති බවත් ඒ අනුව තාවකාලික ලේඛනයේ අංක 99 යටතේ දරුවාගේ නම

සඳහන් වූ බවත් නිරීක්ෂණය වේ. පසුව ඉදිරිපත් වූ විරෝධතාව ඉදිරිපත්ව ඇත්තේ ශාන්ත ආනා විද්‍යාලයට බවත් මීට පෙරදී එම පාසලට ලකුණු අඩුව තිබියදී විරෝධතාව ප්‍රතික්ෂේප කළ යුතු තත්ත්වයක් යටතේ අභියාචනා හා විරෝධතා මණ්ඩලය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ලබාදී ඇති තීරණය පිළිබඳ විමර්ශනයක් පැවැත්වීමක් සිදුකර ඇත. විරෝධතා මණ්ඩලය විසින් සිදුකළ ස්ථානීය පරීක්ෂාවේ දී ශාන්ත ආනා විද්‍යාලයට ලකුණු අඩු නොවිය යුතු බවත් වෙනත් පාසල් දෙකකට එනම් කු/නිශ්ශංක විද්‍යාලය සහ කු/මලියදේව ආදර්ශ විද්‍යාලය යන පාසල් දෙකටම ලකුණු අඩු විය යුතු බවත් අනාවරණය කොට ගෙන ඇත. මේ අවස්ථාවේදී, ශාන්ත ආනා විද්‍යාලයට ලකුණු අඩු කිරීම නිවැරදි කිරීම වෙනුවට පැමිණිකරුගේ දරුවාට ඉහත සඳහන් කළ පාසැල් දෙකට ලකුණු දහයක් අඩු කළ යුතුය යන ස්ථාවරයේ සිට කටයුතු කිරීම මත එන පාසල් බලධාරීන් විසින් සම්මුඛ පරීක්ෂණයේදී ශාන්ත ආනා විද්‍යාලයට අඩු කළ ලකුණු පහ සහ විරෝධතා මණ්ඩලය මගින් තවත් ලකුණු පහක් අඩුකොට එනම්,මුළු ලකුණු 10 ක් අඩුකොට ඇත.ඒ අනුව, අවසාන ලේඛනයෙන් දරුවාගේ නම ඉවත් කොට ලකුණු 79.8 ක් යටතේ පොරොත්තු ලේඛනයේ 31වන ස්ථානයේ නම සඳහන් කර ඇත.පසු අවස්ථාවලදී, ආසන්නතාව ගණනය කිරීම සඳහා ගූගල් සිතියම යොදා ගනිමින් විවිධ දුර ප්‍රමාණයන් දක්වමින් ඒකමිතියකින් තොර නිගමනවලට එළඹීමට දෙපාර්ශවයම කටයුතු කර ඇති බවට නිරීක්ෂණය වේ.

එසේම පැමිණිකරු ස්ථිර ලේඛනයෙන් ඉවත් කිරීම සම්බන්ධයෙන් ඔහු නැවත අභියාචනා මණ්ඩලයට කැඳවා නිසි පරීක්ෂණයක් සිදු කළ යුතු බව චක්‍රලේඛයේ 11.6 සඳහන්ව තිබියදීත් වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකරුට එසේ දැනුම් දීමක් සිදුකළ බවට ප්‍රමාණවත් සාක්ෂි ඔස්සේ ඉදිරිපත් කිරීමට වගඋත්තරකරුවන් අපොහොසත්ව ඇත.

කොමිෂන් සභාවේ උපදෙස් මත සහතිකලත් මිනින්දෝරුවකු සිදුකරන ලද දුර ප්‍රමාණ ගණනය කිරීම් වලට අනුව, කු/නිශ්ශංක විද්‍යාලයට පමණක් ලකුණු 5 අඩුවන බවත් කු/ මලියදේව ආදර්ශ විද්‍යාලයට දුර ප්‍රමාණය මත ලකුණු අඩු නොවන බවත් නිරීක්ෂණය වේ.එලෙස ලකුණු පහක් අනීතිකව අඩු නොකලේ, නම් මෙම දරුවා ලැබූ ලකුණු 84.8 ක් ලෙස නොවෙනස්ව පවතින බවත් ඒ අනුව මේ වන 2023 වර්ෂයේ පොරොත්තු ලේඛනයේ අවසාන ලකුණ 83 බැවින් පැමිණිලිකරුගේ දරුවාද පාසලට ඇතුලත්ව කර ගැනීමේ හැකියාවක් තිබූ බවත් නිගමනය කල හැක. මේ අනුව 1 වන සහ 2 වගඋත්තරකරුවන්ගේ ක්‍රියා කලාප හේතුවෙන් පැමිණිලිකරුගේ දරුවාට කු/මලියදේව පිරිමි විද්‍යාලයට ඇතුළත් වීමේ අවස්ථාව අහිමි වී ඇත.

2022.06.15 දිනැති අංක 28/2022 දරණ, 2023 පාසල්වල පළමු ශ්‍රේණියට ළමුන් ඇතුලත් කර ගැනීමේ චක්‍රලේඛය මගින් බලය අභිනියෝජනය කරමින් පිහිටුවා ඇති අභියාචනා විරෝධතා මණ්ඩලය සහ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය චක්‍රලේඛ ප්‍රකාරව තමාට පැවරී ඇති කාර්යය හා බලතල අනුව කටයුතු කිරීම වෙනුවට අතපසුවීම් සිදුකරමින් නොසැලකිලිමත්ව කටයුතු කර ඇති බවත්, ආසන්නතාවය ගණනය කිරීමේදී විවිධ දුර ප්‍රමාණයන් දක්වමින් ඒකමිතියකින් තොර තීරණවලට වරින් වර එළැඹී ඇති බවට නිරීක්ෂණය වේ. තවදුරටත් කු/මලියදේව පිරිමි විද්‍යාලයේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය හා අභියාචනා විරෝධතා මණ්ඩලය පරිපාලන අධිකාරීන් වශයෙන් සිය අභිමත බලය ක්‍රියාත්මක කිරීමේදී 28/2022 අංක දරන චක්‍රලේඛය මාර්ගෝපදේශ කොට ගනිමින්, එකී නෛතික ලේඛනය මත පදනම්ව ක්‍රියාකල යුතුව ඇත. ඒ අනුව වගඋත්තරකරුවන් නිසි පරිදි ක්‍රියා කර ඇති බව නිරීක්ෂණය නොවේ.

මේ අනුව නිගමනය කළ හැක්කේ, කු/මලියදේව විද්‍යාලයේ විදුහල්පතිවරයා ඇතුළු පාසල් බලධාරීන් හා එහි අභියාචනා මණ්ඩලයේ සභාපතිවරයා ලෙස ක්‍රියා කළ දෙවන වගඋත්තරකරුගේ ක්‍රියා කලාපයන් මගින් පැමිණිලිකරුගේ දරුවාට ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (1) ව්‍යවස්ථාව ප්‍රකාරව තහවුරු කර ඇති මූලික අයිතිවාසිකම් එකී වගඋත්තරකරුවන් විසින් උල්ලංඝණය කර ඇති බවයි.

මෙම සමස්ථ සිදුවීම සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමේදී පැමිණිකරුගේ දරුවා සම්බන්ධයෙන් 1 සහ 2 වගඋත්තරකාර පාර්ශවයන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දොළොස්වැනි ව්‍යවස්ථාව යටතේ දැක්වෙන මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කොට ඇති බව නිගමනය කළ හැක.

ඒ අනුව පහත සඳහන් නිර්දේශ කර සිටී

1. පැමිණිකරුගේ දරුවා කුරුණෑගල මලියදේව පිරිමි විද්‍යාලයේ නියමිත ශ්‍රේණිය සඳහා ඇතුළත් කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්, ජාතික පාසල් අධ්‍යක්ෂක හා විදුහල්පතිවරයා විසින් කටයුතු කළ යුතු වේ.

2. 01 වන සහ 2 වන වගඋත්තරකරුවන්ගේ ක්‍රියා කලාපය සම්බන්ධයෙන් පරීක්ෂා කොට සුදුසු පියවර ගෙනයාමානව හිමිකම් කොමිෂන් සභාව වෙත වාර්තා කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්වරයා විසින් කටයුතු කළ යුතුය.

පළමුවන නිර්දේශය 2025..02.02...... දිනට පෙර ද ,දෙවන නිර්දේශය 2025..04.10...... දිනට පෙරද ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 (7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම පැමිණිලිකරු විසින් කොමිෂන් සභාවට දැනුම් දිය යුතු අතර එදිනට පෙර අදාළ දැනුම් දීම සිදු කරන්නේ නම් පසු ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම සම්බන්ධයෙන් සලකා නොබලන බව ද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී.දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු ( හිටපු),
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.
සභාපති

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී.පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන්

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත -

1. අමාත්‍යතුමා - කරුණු දැනගැනීම සඳහා
අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල

2 . ලේකම්, - (අදාල නිර්දේශය ක්‍රියාත්මක කිරීම සඳහා)
අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල

3. ජාතික පාසල් අධ්‍යක්ෂක, - (අදාල නිර්දේශය ක්‍රියාත්මක කිරීම සඳහා)
අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල